# කැලණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨයේ ස්ථාපිත විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානයේ (Scientific Glass Blowing Center) තත්ත්වය උසස්කර එහි ක්‍රියාකාරකම් වඩාත් විධිමත් සහ කාර්යක්ෂම කිරීම තුළින් වඩාත් ඵලදායී විශිෂ්ට සේවාවක් පුළුල් සේවාදායක ප්‍රජාවකට සැපයීම

## විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානයේ වැදගත්කම හා එහි සේවාවන්

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල, පාසැල්, පර්යේෂණ ආයතන, ආරෝග්‍යශාලා, ඇතුළු නොයෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා අවශ්‍ය වන විද්‍යාත්මක වීදුරු භාණ්ඩ (Scientific Glassware) පිටරටින් ගෙන්වීමට වාර්ෂිකව දැවැන්ත මුදලක් වැය කෙරේ. වීදුරු භාණ්ඩවල ඇති ඉක්මනින් බිඳෙන සුළු බව නිසා, මෙම වීදුරු භාණ්ඩ නැවත නැවතත් ගෙන්වීමට වීමෙන් පිටරටට ඇදී යන මුදල් ප්‍රමාණය අති විශාලවේ.

විද්‍යාත්මක වීදුරු උපකරණ අළුතින් ම නිපදවීමත්, අධික මිල සහිත විද්‍යාත්මක වීදුරු භාණ්ඩ කැඩුණු පසු ඒවා නැවත භාවිතයට ගත හැකි වනසේ සකස් කිරීමත් අප විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ඇති වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානය මගින් සිදු කෙරේ. මෙලෙස භාවිතයට ගත හැකි සේ පිළිසකර කරනු ලබන විද්‍යා වීදුරු භාණ්ඩ අතර නිතර විද්‍යාගාරයේ දී භාවිත වන පරීක්ෂණ නල, මිනුම්සරා, බීකර, ප්ලාස්කු, බියුරෙට්ටු, පිපෙට්ටු, කන්ඩෙන්සර වැනි දෑ සහ තවත් නොයෙකුත් සංකීර්ණ විද්‍යා වීදුරු උපකරණ වේ. සමහර පර්යේෂණ සඳහා අවශ්‍ය වන විශේෂිත විද්‍යාත්මක වීදුරු උපකරණ කොතරම් අධික මිලකටවත් මිලදී ගත නොහැකි වන අතර, ඒවා අවශ්‍යතාවය අනුව විශේෂිත ආකාරවලට සකස් කර ගත යුතුයි. එවැනි විශේෂිත ආකාරයේ විද්‍යා උපකරණ නිපදවීමත් අප මධ්‍යස්ථානය මගින් කෙරෙන සුවිශේෂී මෙහෙවරකි. එමගින්, විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන ඇතුළු සමහර රජයේ සහ පෞද්ගලික ආයතන හා කර්මාන්ත ශාලාවල පර්යේෂණ කටයුතුවලට අප මධ්‍යස්ථානය ඍජුවම දායකත්වයක් සපයයි.

මීට අමතරව විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ ශිල්පය ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය පුහුණු පාඨමාලා පැවැත්වෙන අතර, මේ යටතේ වීදුරු උපකරණ නිර්මාණ ශිල්පය පිළිබඳ උනන්දුවක් දක්වන වෙනත් විශ්වවිද්‍යාලවල සේවකයින්, පාසැල් ගුරුවරුන් සහ විවිධ ප්‍රදේශවල ව්‍යවසායදායකයින් සඳහා පුහුණු කිරීම් මෙම මධ්‍යස්ථානය මගින් සිදු කෙරේ.

එමෙන්ම, විද්‍යාත්මක වීදුරු උපකරණවලට අමතරව අප මධ්‍යස්ථානය මගින් විසිතුරු වීදුරු භාණ්ඩ නිපදවීම සිදු කෙරෙන නමුත්, දැනට පවතින මානව සම්පත් හිඟය නිසා වැඩි පුමුඛතාවයක් දෙනු ලබන්නේ විද්‍යාත්මක වීදුරු උපකරණ නිපදවීම සඳහායි.

## විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානය දක්වා ආ ගමන් මග

වසර 1990 දී, එවකට රසායන විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කළ ආචාර්ය කීර්ති වික්‍රමසිංහ මහතාගේ සංකල්පයකට අනුව උප කුලපති මහාචාර්ය එම්. එම්. ජේ. මාරසිංහ මහතාගේ පූර්ණ සහයෝගය ඇතිව, විශ්ව විද්‍යාලයීය මූල්‍ය ප්‍රතිපාදන මගින්, විද්‍යාත්මක වීදුරු නිපදවීමේ සහ පිළිසකර කිරීමේ මූලික පහසුකම් රසායන විද්‍යා අංශය තුළ ස්ථාපිත කරන ලදී. මේ සඳහා රසායන විද්‍යා අංශයේ කාර්මික නිලධාරි මහතෙකු වූ එම් තිලකරත්න මහතාගේ සේවය යොදවා ගැනිණි. මෙම පහසුකම මගින්, රසායන විද්‍යා අංශයේ විද්‍යාගාර තුල කැඩුණු හෝ බිඳුණු විද්‍යාත්මක වීදුරු භාණ්ඩ අළුත් වැඩියා කර ගැනීමට හැකි විය.

මෙසේ රසායන විද්‍යා අංශය තුළ පටන් ගත් විද්‍යාත්මක වීදුරු නිපදවීමේ සහ පිළිසකර කිරීමේ පහසුකම අද වන විට වඩාත් දියුණු මධ්‍යස්ථානයක් බවට පත් වී තිබේ. මෙකී දියුණුවට ඉවහල් වූ වැදගත් පියවර කිහිපයක් පහත දැක්වේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ, විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානයට මූලික ශක්තියක් ලැබුණේ 1993 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලය හා බ්‍රිතාන්‍යයේ ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලය අතර ස්ථාපිත වූ ජීව රසායන විද්‍යා (Biochemistry) සහයෝගිතා වැඩ සටහන යටතේයි. මේ යටතේ බ්‍රිතාන්‍ය කවුන්සිලයේ අධ්‍යක්ෂ ජෝන් ජේන් මහතාගේ පූර්ණ ආශිර්වාදය මත, බ්‍රිතාන්‍ය කවුන්සිලය මගින් සපයන ලද මුදල් ප්‍රතිපාදන මගින් රසායන විද්‍යා අංශයේ කාර්මික නිලධාරී එම් තිලකරත්න මහතා බ්‍රිතාන්‍යයේ ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයේ හය මසක පුහුණුවකට යවනු ලැබීය. ඔහු විද්‍යාත්මක වීදුරු හැසිරවීම පිළිබඳව පුහුණුව ලැබූ පළමු ශ්‍රී ලාංකිකයා වේ.

ඉන් පසු 1999 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ ඒකකයේ දියුණුවට අති දැවැන්ත සහයෝගයක් ලැබුනේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ හඳුන්වා දුන් ආසියානු සංවර්ධන බැංකු (Asian Development Bank) මුදල් ප්‍රතිපාදන මගිනි. ඒ සඳහා උප කුලපති මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතාගේ සහ එවකට විද්‍යා හා තාක්ෂණ අමාත්‍ය වූ මහාචාර්ය තිස්ස විතාරණ මහතාගේ පූර්ණ සහයෝගය ලැබුණි. මෙම ප්‍රතිපාදන මගින්, කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානය අද පවතින තත්ත්වයට ගෙන ඒමට ඉවහල් වූ පහත දැක්වෙන කාර්යයන් ඉටු කර ගැනීමට හැකි විය.

- විද්‍යා පීඨයේ ගොඩනැගිල්ලක් තුළ, එකවර සයදෙනෙකු වීදුරු උපකරණ නිපදවීම පිළිබඳව පුහුණු කිරීමට අවශ්‍ය පහසුකම් සහිත මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.

- විද්‍යාත්මක වීදුරු උපකරණ නිපදවීම හා අළුත් වැඩියා කිරීම සඳහාත්, විද්‍යාත්මක වීදුරු හැසිරවීමේ කාර්මික ශිල්පීන් පුහුණු කිරීම සඳහාත් අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා අධික උෂ්ණත්වයට ඔරොත්තු දෙන බෝරෝසිලිකේට් (Borosilicate) වීදුරු බට හා වීදුරු දඬු තොග මිලදී ගැනීම.

- එම්. තිලකරත්න මහතාට නැවත වරක් බ්‍රිතාන්‍යයේ එඩින්බරා විශ්වවිද්‍යාලයේ හය මසක පුහුණුවක් ලබා දීම.

- විද්‍යාත්මක වීදුරු උපකරණ නිපදවීම පිළිබඳව බ්‍රිතාන්‍ය විශේෂඥ පුහුණු කරුවන් සහභාගී කරවා ගනිමින් කැලණිය විශ්වවිද්‍යාලය තුළ පුහුණු කිරීමේ පාඨමාලා දෙකක් පැවැත්වීම.

- ඉහත පුහුණු පාඨමාලා හැදෑරීමෙන් පසු ඉහළ දක්ෂතා දැක් වූ අයෙකු වන එවකට විද්‍යා පීඨයේ කාර්මික තනතුරේ සේවය කරමින් සිටි සී තුඩුහේන මහතාට 2004 වසරේ දී බ්‍රිතාන්‍යයේ ග්ලාස්ගෝ සහ එඩින්බරා විශ්වවිද්‍යාල දෙකෙහි හය මසක පුහුණුවක් ලබා දීම.

ඉහත ප්‍රතිපාදන ලබා ගනිමින්, විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානය අද තිබෙන තත්ත්වයට ගෙන ඒම සඳහා ඉමහත් වූ කැපවීමකින් වැඩ කළ, එවකට රසායන විද්‍යා අංශයේ අංශාධිපති වූ ආචාර්ය කීර්ති වික්‍රමසිංහ මහතාණන් ඉතාමත් කෘතඥ පූර්වකව සිහිපත් කළ යුතුයි. එතුමාගේ දැක්ම වූයේ මෙම මධ්‍යස්ථානය ජාතික මට්ටමේ විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානයක් බවට පත් කර, එය දකුණු ආසියානු කලාපය තුළ විද්‍යාත්මක වීදුරු හැසිරවීම පිළිබඳව පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් බවට පත් කිරීමයි. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල, පාසැල්, පර්යේෂණ ආයතන ඇතුළු නොයෙකුත් රජයේ හා පෞද්ගලික ආයතනවලට අවශ්‍ය විද්‍යාත්මක වීදුරු උපකරණ නිෂ්පාදනය හා අළුත් වැඩියාව මගින් ජාතික ධනය එතෙර යැවීම අවම කරවීමත්, රට තුළ රැකියා අවස්ථා ජනනය කිරීමත් වන උදාර අරමුණු සහිතව මෙම මධ්‍යස්ථානය ගොඩ නගා ඇති බව අදාල ලියවිලි මගින් පෙන්නුම් කරයි.

තිලකරත්න මහතා 2009 වසරේදී විශ්‍රාම ගිය අතර, පැවති චක්‍ර ලේඛවල බඳවා ගැනීමේ පටිපාටිවලට අනුව සී තුඩුහේන මහතා වීදුරු හැසිරවීමේ මධ්‍යස්ථානයේ තනතුරකට පත් කිරීම අතිශයින් දුෂ්කර විය. දැනට සී තුඩුහේන මහතා සහකාර වීදුරු හැසිරවීමේ නිලධාරී (Assistant Glass blower) ලෙස සේවය කරයි.

රසායන විද්‍යා අංශය තුළ ආරම්භ වූ මෙම විද්‍යාත්මක වීදුරු නිපදවීමේ සහ පිළිසකර කිරීමේ ඒකකය දැනට විද්‍යා පීඨය මගින් පාලනය වන අංග සම්පූර්ණ විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානයක් බවට පත්ව ඇත.

**වඩාත් ඵලදායි විශිෂ්ඨ සේවාවක් පුළුල් සේවාදායක ප්‍රජාවකට ලබා දීම සඳහා යෝජිත ක්‍රියාමාර්ග.**

වර්තමාන විද්‍යා පීඨාධිපතිනිය කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානය වෙත දක්වන ලද විශේෂ උනන්දුවත්, උපකුලපතිතුමාගේ උනන්දුව සහ සහයෝගයත් මත එහි දැනට පවතින තත්ත්වය උසස් කිරීමෙහි ලා පහත දැක්වෙන ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වී ඇත.

වැදගත්ම අවශ්‍යතාවය ලෙස පෙනී යන්නේ විද්‍යාත්මක වීදුරු හැසිරවීමේ ශිල්පයට උනන්දුවක් දක්වන යම් නිර්මාණශීලී හැකියාවක් දක්වන පුද්ගලයින් මෙම මධ්‍යස්ථානයේ සේවයට බඳවා ගැනීමයි.

එහි මූලික පියවරක් ලෙස මීට වසර පහළොවකට පමණ පෙර මෙම මධ්‍යස්ථානයේම පුහුණුව ලැබූ, එවකට රසායන විද්‍යා අංශයේ සේවය කළ ජේ ආර් නානායක්කාර මහතා, වෛද්‍ය පීඨයේ විද්‍යාගාර සහායක තනතුරෙහි සේවය කරමින් සිටිය දී විශේෂ ඉල්ලීමක් මත විද්‍යා පීඨයට අනුයුක්ත කර විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානයේ සේවයට යොදවන ලදි. මොහු විද්‍යාත්මක වීදුරු නිපදවීමේ සහ පිළිසකර කිරීමේ පුහුණුව ලබා තිබීමට අමතරව සහජ නිර්මාණශීලී හැකියාවක් ඇති අයෙකුද වේ.

දැනට සේවය කරන සේවකයින් දෙදෙනාගේ ඉංග්‍රීසි දැනුම හා පරිගණක සාක්ෂරතාව වැඩි කිරීමට අවශ්‍ය මූලික අඩිතාලම මේ වන විට යොදා ඇත. මෙම කුසලතා වර්ධනය කර ගැනීම මගින්, සන්නිවේදන හැකියාව දියුණු කර ගැනීමත්, අන්තර් ජාලය හරහා වීදුරු තාක්ෂණ ශිල්පය පිළිබඳ දැනුම යාවත්කාලීන කර ගැනීමත් බලාපොරොත්තුවේ.

මීට අමතරව වීදුරු තාක්ෂණ ශිල්පය පිළිබඳව උනන්දුවක් දක්වන අප විශ්වවිද්‍යාලයේ සේවකයන් දැනුවත් කර ඔවුනට පුහුණුවක් ලබා දීමට අදහස් කෙරේ. මෙම ශිල්පය ඉතාමත්ම සූක්ෂමව නිර්මාණශීලිත්වය මුල් කර ගෙන කල යුතු වන අතර අසීරුවෙන් හෝ මේ සඳහා දක්ෂයින් සොයා ගැනීම මෙහි අරමුණයි.

මීට පෙර වීදුරු තාක්ෂණ පාඨමාලා දෙකටම සම්පත් දායකත්වය සැපයූ බ්‍රිතාන්‍යයේ එඩින්බරා විශ්වවිද්‍යාලයේ වීදුරු තාක්ෂණ ශිල්ප උපදේශක එස් ජොන්ස්ටන් මහතාගේ විශේෂඥ

සේවය ලබා ගනිමින් දින තිහක පුහුණු පාඨමාලාවක් මේ වසරේ අග භාගයේ පැවැත්වීමට කටයුතු යොදමින් පවතී. මෙම පුහුණු පාඨමාලාවට සුදුස්සන් තෝරා ගැනීමේ දී ඉහතින් සඳහන් කළ පුහුණුවීම්වලදී විශේෂ දක්ෂකම් දැක්වූ අයට පුමුඛතාවය දෙන අතර වෙනත් විශ්වවිද්‍යාල හා ආයතනවල පුහුණු වීමට කැමති අය සිටී නම් ඒ අයට ද අවස්ථාවක් ලබා දීමට බලාපොරොත්තු වේ.

මෙම මධ්‍යස්ථානය වෙතින් වඩාත් කාර්යක්ෂම, ඵලදායී සේවාවක් ලබා ගැනීම සඳහා මධ්‍යස්ථානය තුළ යන්ත්‍රෝපකරණ විධිමත්ව ස්ථාපිත කිරීමත්, පුහුණු පාඨමාලා පැවැත්වීමට වඩාත් යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම සඳහාත් අවධානය යොමු කර ඇත.

දැනට අප මධ්‍යස්ථානයෙන් සපයන සේවාවන් පිළිබඳව පුළුල් ලෙස දැනුවත් කිරීම සඳහා අළුතින් වෙබ් අඩවියක් සහ අත් පත්‍රිකා සකස් කර ඇත. අනෙකුත් විශ්වවිද්‍යාල, පාසැල්, පර්යේෂණ ආයතන, ඇතුළු රජයේ සහ පෞද්ගලික ආයතන දැනුවත් කිරීම පිළිබඳව විශේෂ අවධානය යොමුකිරීම මගින් පුළුල් සේවාදායක ප්‍රජාවක් සම්බන්ධ කර ගැනීමට බලාපෙරොත්තුවේ.

මෙම විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානය ඉදිරියේදී ජාතික මට්ටමේ මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා අවශ්‍යවන වැදගත්ම සාධකය වන පුහුණු වීදුරු කාර්මික ශිල්පීන් බඳවා ගැනීමේ වැදගත් කම පිළිබඳව රජයේ අවධානය යොමු කරවීමට බලාපොරොත්තුවේ. දැනට ලංකාවේ ඇති එකම විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානය වන මෙය රැක ගැනීම අප සැමගේ ජාතික වගකීමයි.

මහාචාර්ය චන්දිමා ජයසූරිය
සම්බන්ධීකාරක
විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානය
විද්‍යා පීඨය
කැලණිය විශ්ව විද්‍යාලය
දුරකථන: 0112903265, 0112903207, 0714311286
ෆැක්ස් : 0112903203
විද්‍යුත් තැපෑල: jayasuc@kln.ac.lk, jayasuc@gmail.com
වෙබ් අඩවිය: https://science.kln.ac.lk/units/gbc/